# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/63 - 2022 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2022.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/02/2018/182.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.02.10 දිනැති හා අංක 2266/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.02.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් රත්නපුර, මල්වල පාර, අංක 23 ඒ හි පිහිටි ලංකා වතු සේවා සංගමය ප්‍රාදේශීය කාර්යාලය (රමණී ජයකොඩි මිය වෙනුවෙන්) සහ තලවකැලේ, ශාන්ත කුම්බස් හි පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, රත්නපුර පිහිටි ශාන්ත ජෝකිම් වත්ත අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.08 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.

1A - G 37345 — 13 (2022/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

IR/COM/02/2018/182

නඩු අංකයඃ A/09/2022

ලංකා වතුසේවා සංගමය,
ප්‍රාදේශීය කාර්යාලය,
අංක 23 ඒ, මල්වල පාර,
රත්නපුර.
(රමණී ජයකොඩි මිය වෙනුවෙන්)

*පළමු පාර්ශවය*

සහ

01. ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය,
ශාන්ත කුම්බස්,
තලවකැලේ.

02. ශාන්ත ජෝකිම් වත්ත,
රත්නපුර.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**පෙනී සිටීම -**

පළමු පාර්ශවය වෙනුවෙන් -
ලංකා වතුසේවා සංගමයේ නියෝජිත
ධනුක විජේගුණරත්න මහතා

දෙවන පාර්ශවය වෙනුවෙන් -
01. ශාන්ත ජෝකිම් වත්තේ වතු අධිකාරී ක්‍රිස්ටි ජයසේකර මහතා
02. ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලයේ පරිපාලන නිළධාරී මදුර බස්නායක මහතා
03. නීතිඥ නවීන් ගුණසේකර

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාලද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.**

''ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලයට අයත් ශාන්ත ජෝකිම් වත්තේ සේවය කරන රමණි ජයකොඩි මහත්මියට පෙර ලබා දී ඇති පදනමින් 203.10.01 දින සිට ක්‍රියාත්මක වූ වැටුප් වර්ධක ලබා දීම 2014.05.01 දින සිට අත්හිටුවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද ? යන්න පිළිබඳව වේ''.

දෙපාර්ශවය විසින් පළමු ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව ප්‍රථමවරට මෙම නඩුව විභාග කිරීම සඳහා කැඳවූ 2022.03.08 දින පළමු පාර්ශවය විසින් ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් තම කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඉහත සේවිකාව 1994.06.01 දින සිට දෛනිකව වැටුප් ලබන කම්කරුවකු ලෙස චෙක්රෝලෙහි සේවය කර ඇත. එහෙත් වසර 2001 සිට එම සේවිකාව තවත් සේවකයින් කිහිපදෙනෙකු සමග කණිෂ්ඨ කාර්ය මණ්ඩල ගණයට ඇතුලත්කර චෙක්රෝලෙන් දෛනික වැටුප් ගෙවා තිබේ. ඒ අනුව 2003 සහ 2008 වසර වලදී අත්සන් කරන ලද සාමූහික ගිවිසුම්වල වැටුප් වැඩිවීමට සමාන්තරව මෙම සේවිකාවගේද දෛනික වැටුප කණිෂ්ඨ කාර්යය මණ්ඩල ගණයට ඇතුලත්ව වැඩි කර ඇත. නමුත් 2014 වසරේ දී අත්සන් කරන ලද සාමූහික ගිවිසුමේ වැටුප් වැඩිවීමට සමාන්තරව 2014 අප්‍රේල් මාසයේදී මෙම සේවිකාව වන රමණී ජයකොඩි මහත්මියට පෙර පරිදිම වැටුප් වැඩිකර ලබාදුන් නමුත් 2014 මැයි මාසයේදී එම වැටුප් වැඩිවීම ඉවත්කර වැඩිපුර ලබාදුන් මුදල් 2014 මැයි සිට 2014 සැප්තැම්බර් මස දක්වා නැවත අයකරගෙන ඇත. ඒ අනුව 2014 වසරේදී අත්සන් කරන ලද සාමූහික ගිවිසුමට සමාන්තරව අප්‍රේල් මාසයේ වැටුප වැඩිකර, නැවත කිසිදු හේතුවක් නොදන්වා එම වසරේ මැයි මස සිට වතුකම්කරුවන්ගේ දෛනික වැටුප් තලයට මෙම සේවිකාවගේ වැටුප අඩුකර 2014 වර්ෂයේදී ලබාදුන් වැටුප් වැඩිවීම මාසිකව අඩුකර ගැනීමෙන් රමණී ජයකොඩි මහත්මියට ඉමහත් අසාධාරණයක් සිදුවී ඇති බව ලංකා වතුසේවා සංගමයේ නියෝජිතයා වශයෙන් පෙනී සිටි ධනුක විජේගුණරත්න මහතා ප්‍රකාශ කර සිටින ලදී.

ඒ අනුව මෙම ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් වගඋත්තරකාර දෙවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි ශාන්ත ජෝකිම් වත්තේ වතු අධිකාරී ක්‍රිස්ටි ජයසේකර මහතා කියා සිටියේ මෙම සේවිකාව වන රමණී ජයකොඩි මහත්මිය 2019.10.31 දින ව්‍යවස්ථාපිත දීමනා සියල්ලද ලබාගෙන සේවයෙන් ඉවත්ව ගොස් ඇති බවත් අදාල කාලයේ තමා එම වත්තේ වතුඅධිකාරී ලෙස සේවය නොකල බැවින් ඒ පිළිබඳව වැඩිදුර විස්තර ප්‍රකාශ කිරීමට අපහසු බවයි. ඒ අනුව පැමිණිලිකාර පාර්ශවයෙන් ඉදිරිපත් කල කරුණු සහ ගොණු කල ප්‍රකාශ අනුව වර්ෂ 2000ට පසු 2003, 2008 සහ 2014 වර්ෂවල අත්සන් කරනලද සාමූහික ගිවිසුම් ප්‍රකාරව මෙම ඉල්ලුම්කාරියට කණිෂ්ඨ කාර්ය මණ්ඩල ගණයට ඇතුලත්කර වැටුප් වැඩිකර තිබේද යන්නත්, 2014 වර්ෂයේ මැයි මාසයේදී එම වැටුප් වැඩිවීම ඉවත් කර තිබේද යන්නත්, එසේ 2014 වසරේ ගෙවන ලද වැඩි වැටුප නැවත අයකරගෙන තිබේද යන්නත්, එසේ කලේ නම් කුමන හේතුවක් පදනම් කරගෙනද යන්නත්, ඉල්ලුම්කාරියට සහ අනෙකුත් සමාන්තර සේවකයින්ට ගෙවා ඇති වැටුප් පරිමාණයන් කුමක්ද යන්නත්, එසේ ගෙවන ලද වැටුප් වාර්තාවල විස්තරයකුත් මීලග නඩු දිනයේදී ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී. මීට අමතරව ඉල්ලුම්කාරියගේ නිවාඩු පිළිබඳව විස්තරද, ඇය චෙක්රෝලයේ වැටුප් ලැබූ සේවිකාවක්ද යන්නත් එසේනම් අදාල චෙක්රෝල්වල පිටපත් ආදී තොරතුරුද මීලග නඩු දිනය වන 2022.03.15 දිනට ඉදිරිපත් කරන ලෙසටද වැඩිදුරටත් නියෝග කරන ලදී.

ඒ අනුව 2022.03.15 දින නැවතත් නඩුව කැඳවූ අවස්ථාවේදී පෙර නඩු දින වගඋත්තරකාර පාර්ශවය වෙතින් ඉල්ලා ඇති කරුණු

වලට පිළිතුරු දෙමින් වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් පෙනී සිටි ශාන්ත ජෝකීම් වතු අධිකාරී ක්‍රිස්ටි ජයසේකර මහතා ප්‍රකාශ කර සිටියේ, 2014 වසරේ අත්සන් කරන ලද සාමූහික ගිවිසුම් ප්‍රකාරව ඉල්ලුම්කාර පාර්ශවය වෙත 2014 අප්‍රේල් මාසයේදී ලබාදුන් වැටුප් වැඩිවීම එම වසරේ මැයි මස සිට නවතා ඇති බවත් එම වැටුප් වැඩිවීම මාස 5ක් තුල නැවත අයකරගෙන ඇති බවත්ය. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි ක්‍රිස්ටි ජයසේකර මහතා තවදුරටත් කියා සිටියේ මෙහි ඉල්ලුම්කාරිය වන රමණී ජයකොඩි මහත්මිය වෙත ලබාදුන් වැටුප් වැඩිවීම අහිමිකිරීමට කිසිදු සාධාරණ හේතුවක් එවකට සිටි පාලන අධිකාරිය විසින් ලිඛිතව දැනුම්දීමක් කර නොතිබූ බවත්ය. මෙහිදී පැමිණිලිකාර පාර්ශවයට යම් අසාධාරණයක් වී ඇති බව වගඋත්තරකාර පාර්ශවයද පිළිගත් අතර ඒ අනුව 2014 අප්‍රේල් මස සිට ඉල්ලුම්කාරිය තම රැකියාවෙන් ඉවත්වගිය 2019 ඔක්තෝබර් 31 දින දක්වා ගෙවීමට ඇති හිඟ මුදල් ගණනය කර 2022.04.26 දිනට පෙර කාර්මික අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී. එම ගණනය කිරීම් අනුව මීලඟ නඩු දිනයේදී දෙපාර්ශවය සමග සාකච්ඡාකර ගෙවීමට ඇති හිඟ මුදල සම්බන්ධයෙන් එකගතාවයකට පැමිණීමට බලාපොරොත්තු වන බවද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මීලඟ නඩු දිනය වූ 2022.06.08 වෙනි දිනට පෙර වගඋත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාරිය වන රමණී ජයකොඩි මහත්මිය වෙත ලබාදීමට නියමිත හිඟ වැටුප් පරිමාව කාර්මික අධිකරණය වෙත ලිඛිතව ඉදිරිපත් කර තිබුණි.

2022.06.08 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ වගඋත්තරකාර දෙවන පාර්ශවයේ ශාන්ත ජෝකීම් වතුයායේ අධිකාරී ක්‍රිස්ටි ජයසේකර මහතා එම හිඟ වැටුප් වාර්තාව කම්කරු අධිකරණයට නැවත ඉදිරිපත් කල අතර දෙපාර්ශවය අතර සාකච්ඡාවකින් අනතුරුව රුපියල් දෙලක්ෂයක (රු. 200,000.00) මුදලක් අවසාන හිඟ වැටුප් වශයෙන් ගෙවීමට වගඋත්තරකාර පාර්ශවය එකඟ විය. අවසාන හිඟ වැටුප වශයෙන් එම මුදල ලබාගැනීමට පැමිණිලිකාර පාර්ශවයෙන්ද එකඟත්වයක් පලවිය.

**ප්‍රදානය**

මෙම බේරුම්කාර නඩුවට අදාලව දෙපාර්ශවයේම එකඟත්වයෙන් එළඹි සමත යෝජනාව අනුව පළමු පාර්ශවය වන ලංකා වතුසේවා සංගමයේ සාමාජිකා රමණී ජයකොඩි මහත්මිය වෙනුවෙන් 2014 අප්‍රේල් මස සිට ඉල්ලුම්කාරිය තම රැකියාවෙන් ඉල්ලා අස්වූ 2019.10.31 දින දක්වා අහිමි කරන ලද අවසාන හිඟ වැටුප ලෙස රුපියල් දෙලක්ෂයක මුදලක් (රු.200,000.00) සහකාර කම්කරු කොමසාරිස්, රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත තැන්පත් කරන ලෙසට වගඋත්තරකාර පාර්ශවය වන ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලයට අයත් රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ අධිකාරී ක්‍රිස්ටි ජයසේකර මහතා වෙත නියෝග කරන ලදී. තවද මෙම අවසාන හිඟ වැටුප, ප්‍රදානය ගැසට් ගත කල දින සිට මසක් ඇතුලත ගෙවීමටද නියෝග කරන ලදී.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

රමාල් අයි. සිරිවර්ධන,
බේරුම්කරු.

2022 ජුනි මස 08 වැනි දින,

EOG 08-0263